කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.31,700,777 ක් වූ ආරම්භක ශේෂ නිවැරදි කිරීමේදී ඊට අනුරූපී සංසන්දනාත්මක දත්ත සංශෝධනය කර නොතිබුණි.

(ආ) දේපළ, පිරියත හා උපකරණ වැනි වැදගත් මූල්‍ය ප්‍රකාශන අයිතමයන්ට අදාළ උපලේඛන ඉදිරිපත් කිරීමේදී ඊට අදාළ සංසන්දනාත්මක අගයන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙහි අඩු අගයට වර්ෂ අවසන් තොග අගය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පතු 02 ක සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ පිළිවෙලින් රු.75,822 ක් හා රු.289,393 ක්වූ පොලී ආදායම් ගිණුම්ගත කර නොතිබූ අතර, ස්ථාවර තැන්පත් ශේෂයද රු.365,215 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට කර්මාන්ත තැන්පත් ගිණුමේ ශේෂය හා උපලේඛනයේ ශේෂය අතර රු.162,389 ක වෙනස නිශ්චිතව හඳුනා නොගෙන ජ්නල් සටහනක් මගින් ඉවත් කර තිබුණි.

(ඇ) මුද්දර ගාස්තු ආදායම් රු.6,000,000 ක් උත්පාදිත ආදායම් ප්‍රභවයක් වන සේවා සඳහා ගාස්තු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සතිපොළ ගාස්තු රු.2,190,780 ක් උත්පාදිත ආදායම් ප්‍රභවයක් නොවන වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී රු.117,346 කට මිලදීගෙන තිබුණු උපකරණ සහ උපාංගවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) "අලව්වේගම වත්ත" පොදු ඉඩම් කැබැල්ලේ රු.100,000 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(උ) ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ රු.3,004,453 ක් වූ ඉදිකිරීම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

-------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු.1,434,460 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් අදාළ උපයෝගී ලේඛනවල ශේෂයන් සමග නොසැසඳුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව සේවක ඇප තැන්පත් රු.160,038 ක් වූ නමුත්, සේවක ඇප ආයෝජන රු.157,938 ක් වශයෙන් දක්වා තිබුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ලැබියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට රු.24,849,399 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂයෙහි වර්ෂ 01 ත් 03 ත් අතර වූ රු.1,905,136 ක් සහ වර්ෂ 03 ට වැඩි රු.37,302 ක් වශයෙන් වූ හිඟ මුදල් පැවතුණි.

(ආ) <u>ගෙවියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට රු.14,798,049 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවලින් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් හඳුනාගත හැකි වටිනාකම හැර අනෙකුත් වගකීම් ගෙවා දැමීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

-------------------------------------

එකතු වටිනාකම රු.8,868,421 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණ සහ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම විෂයයන් පිළිබඳ විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවන අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>1958 අංක 2 දරන තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) (සංශෝධන) පනත</u><br><br>23 අ(1) වගන්තිය | කහටගහමුල හේන වත්ත නැමැති අක්කර 12 රූඩ් 3 පර්චස් 36.2 වන පොල් ඉඩම කට්ටි කිරීම සඳහා ඉඩම් කැබලි කිරීමේ පාලන මණ්ඩලයේ අනුමැතිය නොමැතිව ඉදිරිපත් කළ සැලසුම් 06 ක් සඳහා සහ අනුමැතිය ලබාදී තිබුණි. |

(ආ) <u>ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>

| | |
|---|---|
| i. මුදල් රෙගුලාසි 371 (2) | අදාළ කාර්යය නිම වූ විගස අත්තිකාරම් පියවිය යුතු වුවද කාල ප්‍රමාදයන් සහිත රු.61,205 ක අත්තිකාරම් 03 ක් පියවා තිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 571 (2) | තැන්පත් කර වසර 02 ක් ඉක්මවූ රු.75,928 ක් වූ තැන්පතු 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඇ) <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති)</u>

| | |
|---|---|
| 178(3) රීතිය | මෝටර් ග්‍රේඩර් කුලියට ගැනීමේදී සැපයුම්කරුවන් 4 දෙනෙකුගෙන් පමණක් මිල ගණන් ලබාගෙන තිබුණි. |

**02 මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.10,920,871 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.8,177,503 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,743,368 ක වර්ධනයක් සිදු වී තිබුණි.

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය**

----------------------------------

ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම් රු.2,497,244 කින් ඉහළ යාම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

--------------------

**2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

------------------------------------

ලැබියයුතු ආදායම්වල 2015 දෙසැම්බර් 31 දිනට වූ රු.11,816,401 ක සමුච්චිත හිඟය 2016 දෙසැම්බර් 31 දින වන විට රු.12,523,845 ක් දක්වා වැඩි වී තිබුණි.

**2.3.2 වරිපනම්**

----------

පසුගිය වර්ෂවල රු.171,278 ක් වූ හිඟ වරිපනම් සමග සමාලෝචිත වර්ෂය අවසානයට රු.190,744 ක් අයකරගත යුතුව තිබුණි.

**2.3.3 බදු කුලී**

-----------

වර්ෂයේ බිල්කළ බදුකුලී ආදායමෙන් සියයට 99 සමාන රු.1,361,798 ක් අයකර ගැනීමට හැකි වී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 17 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණයක් මත එකක් රු.81,900 බැගින් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමට හැකියාව තිබියදී, මාස 07 ක ප්‍රමාදයක් සහිතව 2016 ඔක්තෝබර් මාසයේදී පරිගණක යන්ත්‍ර 03 ක් මිලදී ගැනීමේදී රු.7,800 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ස්ථාන මාරු/ මිය යාම වැනි හේතු මත වූ රු.40,584 ක සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජල හා විදුලි පහසුකම් ලබාදී නොතිබුණද, අක්කර 02 රූඩ් 02 ක් වූ අලව්වේගම වත්ත වෙන්දේසි කිරීමට අදාළ කට්ටි සැලැස්ම දින රහිතව සභාව විසින් අනුමත කර තිබුණි.

(ආ) අක්කර 12 රූඩ් 03 පර්චස් 36.2 ක් වූ මොරගොල්ල පිහිටි කහටගහමුලහේන ඉඩම, දේපළ වෙන්දේසි කිරීමේ සමාගම විසින් අයිතිකරුගෙන් මිලදී නොගෙන මිලදී ගැනීමට එකඟ වූ ගිවිසුම් මත කට්ටි සැලැසුම් 06 ක් ලේකම් විසින් අනුමත කර තිබුණි. විදුලිය හා නල ජලය ලබාදී නොතිබුණු අතර අභ්‍යන්තර මාර්ග අඩි 30 ක සම්මත විෂ්කම්භයකින් යුක්ත වන පරිදි හැරවුම් ලක්ෂ 05 ක් ඉදිකර නොතිබුණි.

(ඇ) කට්ටි සැලසුම් අනුව පොදු පහසුකම් ඉඩම පර්චස් 179.6 වියයුතු වුවද, පර්චස් 170.6 ක් පමණක් එකිනෙකට දුරස්ව පිහිටි ස්ථාන 05 කින් ලබාදී තිබුණි. තවද එම පොදු ඉඩමේ පර්චස් 92.15 ක් වූ කැබලි 03 ක් අදාළ ඉඩම කෙළවර දුෂ්කර ස්ථානවලින් වෙන්කර තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අවිධිමත් ලෙස තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසුම්ගත නොවී දින රහිත ඇස්තමේන්තුවක් මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෝරා ගනු ලැබූ මාර්ග 24 ක් මෝටර් ග්‍රේඩර් කිරීමේ පළමු අදියර සඳහා රු.1,031,450 ක් ගෙවා තිබුණි. තවද 02 වැනි අදියර යටතේ මාර්ග 14 ක මෝටර් ග්‍රේඩර් කිරීම පැය 132 ක් සඳහා රු.462,490 ක ඇස්තමේන්තුවක් මත පළමු අදියර සිදුකළ කොන්ත්‍රාත්කරුටම ලබාදී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත තැන්පත් උප ලේඛනයට අනුව ජනවාරි 01 දිනට ඇතුලත් කර නොතිබූ එහෙත් 2016 දෙසැම්බර් 31 දිනට එම උපලේඛනයේ 2014 ජනවාරි 24 තැන්පත් දිනය වශයෙන් සඳහන් කරමින් රු.50,000 ක මුදලක් ඇතුළත් කර තිබුණි.

## 3.4 නිෂ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අංක 53-6111 දරන කැබ් රථය 2015 අගෝස්තු 19 දින සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වන්නිගම පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දින පරිත්‍යාග ලෙස ලැබී තිබුණු කම්බි කණු 133 ක් භාවිතයට ගෙන නොතිබුණි.

**3.5 ආර්ථික නොවූ ගණුදෙනු**

-----------------------------

දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය ලබාගෙන 2009 වර්ෂයේදී රු.3,636,467 ක් වැයකර සභාව ඉදිරිපිට මාර්ගය සංවර්ධනය සහ 2006 වර්ෂයේදී රු.2,000,000 ක් වූ ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකළද රජයේ ප්‍රතිපත්ති මත 2014 වර්ෂයේදී නැවත මාර්ගය සංවර්ධන කිරීම සහ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම මත එය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු වටිනාකම රු.9,002,152 ක් වූ කොන්ත්‍රාත් 07 ක් සඳහා වූ මිල ගණන් ලබා ගැනීම විනිවිදභාවයකින් සිදුකර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ රු.6,177,505 ක් වූ කර්මාන්ත 04 ක් සඳහා වූ පුවත්පත් දැන්වීම් අනුව "කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් " පමණක් යනුවෙන් සඳහන් කර තරඟය සීමාකර තිබුණි.

(ඇ) ඇස්තමේන්තුගත වටිනාකම රු.78,095 ක් වූ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ළිඳ ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද කිරීම හේතුවෙන් ගිවිසුම් අනුව කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත යුතු රු.18,276 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.

**3.7 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

දෛනිකව එකතු කරනු ලබන කසළ වල තිබෙන ඝණ අපද්‍රව්‍ය පරිසරයට මුදාහැර තිබුණි.

**04 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

--------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී වැය විෂයයන් 14 කට අදාළව සම්පූර්ණ මුදල හෝ ඊට ආසන්න ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ආ) මහජන ඉල්ලීම් ලබා ගනිමින් සැලසුම් කර තිබුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘති 43 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 05. පද්ධති හා පාලනය

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දුර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මගින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති පාලනය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | i. වට්නාකම් නිවැරදිව වර්ගීකරණය නොකිරීම.<br>ii. වර්ෂය තුළ එකතු කරන ලද වත්කම් ගිණුම්ගත නොකිරීම.<br>iii. ගිණුම් ශේෂ උපලේඛන සමග නොසැසඳීම් පැවතීම.<br>iv. ගිණුම් සටහන් සඳහා සංසන්දනාත්මක අගයන් ඉදිරිපත් නොකිරීම. |
| (ආ) ආදායම් පාලනය | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| (ඇ) නිවාස දේපළ සංවර්ධනය කර අලෙවි කිරීම | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි අපද්‍රව්‍ය සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් නොතිබීම. |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | i. විධිමත්ව කොන්ත්‍රාත්කරුවන් තෝරා නොගැනීම.<br>ii. ප්‍රමාද ගාස්තු අය නොකිරීම.<br>iii. භෞතික ප්‍රගතිය දුර්වල වීම. |
| (ඊ) වත්කම් පාලනය | වත්කම් නිෂ්ක්‍රීයව පැවතීම. |

(ඇමුණුම)

| වැය ශීර්ෂ අංකය | වැය ශීර්ෂ නාමය | ප්‍රතිපාදිත මුදල රු. | වැය වූ මුදල රු. |
|---|---|---|---|
| 01-103-03 | යන්ත්‍ර සූත්‍ර හා විදුලි භාන්ඩ | 20,000 | - |
| 01-107-01-i | සභනාධාර | 20,000 | - |
| 02-207-2-iv | ජල භීතිකා රෝග නිවාරණ වැඩ සටහන් | 15,000 | - |
| 02-207-2-vii | නාගරික ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් | 10,000 | - |
| 02-207-2-x | ගෙවතු වගා වැඩ සටහන් | 10,000 | - |
| 02-207-2-xi | ශ්‍රමදාන වැඩ සටහන් | 2,000 | - |
| 02-207-2-xii | ඩෙංගු මර්ධන වැඩ සටහන් | 10,000 | 1,190 |
| 03-305-01 | තක්සේරු හා මිනින්දෝරු ගාස්තු | 20,000 | - |
| 05-504-2-ii | පොදු ළිං | 15,000 | 4,950 |
| 05-504-03 | පොදු නාන මංකඩ නඩත්තු | 15,000 | - |
| 06-604-2-i | ගොඩනැගිලි අළුත්වැඩියාව | 30,000 | 4,950 |
| 06-604-2-ii | උපකරණ නඩත්තු | 50,000 | 540 |
| 06-607-03-xiv | ලෝක ළමා දින වැඩසටහන් | 20,000 | - |
| 06-609-03 | ළමා උද්‍යානය සංවර්ධනය | 10,000 | - |